LIFE+



# ජීවිතය උපරිමයෙන් විඳින්න

යූනියන් ඇෂුවරන්ස්
ජෝන් කීල්ස් සමාගමකි

## ජීවිතයේ විවිධ අවධි



1

අවිවාහක තරුණ



2

ප්‍රීතිමත් විවාහක

“ ජීවිතය යනු සැබැවින්ම උද්වේගකර චාරිකාවකි.
ඔබ ජීවිතයේ කුමන අවධියක සිටියත් එය සිහින සහ ප්‍රාර්ථනා
වලින් සමන්විත වේ. ඔබ වෙනුවෙන් මෙන්ම ඔබගේ
ආදරණීයයන් වෙනුවෙන් උපදින ඒ සිහින සහ ප්‍රාර්ථනා වලට
නිසි මූල්‍ය රැකවරණයක් ලැබීමට නම්
ඔබට සරිලන මූල්‍ය සැලැස්මක් තිබීම අතිශයින් වැදගත් ය. ”



3

සුන්දර පවුලක්



4

විශ්‍රාම ජීවිතයට පෙර




5

විශ්‍රාම ජීවිතය

## සාමාන්‍යයෙන්,




රජයේ රෝහල් වල සිදුවන මරණ වලින් **83%** කටම හේතු වන්නේ බෝ නොවන රෝග වේ.



2019 වසරේදී **31,000+** කට අධික පිළිකා රෝගීන් සංඛ්‍යාවක් හඳුනාගෙන ඇත.

වාර්ෂික සෞඛ්‍ය වාර්තාව, සෞඛ්‍ය අමාත්‍යංශය (2019)

### ජීවිතයට හොඳින් සූදානම් වන්න.

ඔබගේ ආදරණීයයන්ගේ අනාගතය පිළිබඳව හොඳින් සිතාබලා ඔවුන්ට නිසි රැකවරණයක් ලබාදෙන්න.

## ඔබට LIFE+ අවශ්‍ය වන්නේ ඇයි?



ඔබගේ ආදරණීයයන්ට පරිපූර්ණ රැකවරණයක් සැලසීමට



අඛණ්ඩව වර්ධනය වන අරමුදලක් නිර්මාණය කරගැනීමට

## LIFE+ යනු කුමක්ද?



ජීවිතය ජයගැනීමට නම් අනාගතය නැණවත්ව සැලසුම් කිරීම සහ අනපේක්ෂිත සිදුවීම් වලට මුහුණ දීමට සූදානමින් සිටීම අතිශයින් වැදගත් ය. එමෙන්ම ඔබගේ පවුල වෙනුවෙන් සුරක්ෂිත සහ මූල්‍ය වශයෙන් ශක්තිමත් අනාගතයක් සහතික කිරීම ඔබගේ වගකීමකි. මේ සඳහා ඇති හොඳම විසඳුමක් නම්, ඔබගේ ආදරණීයයන්ට පූර්ණ රැකවරණයක් සමග ඔබගේ ආයෝජනයට අනාගතයේදී ඉහළ ප්‍රතිලාභ පිරිනමන සැලසුමක් තෝරාගැනීම ය.

Life+ යනු ඒ ආකාරයට ඔබගේ ආදරණීයයන්ට පරිපූර්ණ රැකවරණයක් සලසන අතරම, ඔබගේ ආයෝජනය වෙනුවෙන් ඉහළ ප්‍රතිලාභ පිරිනමන සුවිශේෂී සැලසුමකි.

## LIFE+ සැලසුමේ සුවිශේෂී අංග

### පරිපූර්ණ ආවරණයක්

ඔප්පුහිමියා  අකල් මරණයකට ගොදුරු වුවහොත්, ඔහුගේ/ඇයගේ ආදරණීයයන් වෙනුවෙන් අදාළ අවස්ථාව වනවිට පවතින ආයෝජන ගිණුමේ ශේෂය හෝ මූලික රක්ෂිත මුදල යන දෙකෙන් ඉහළ වටිනාකම හිමි වේ. ඔබට අවශ්‍ය නම්, අතිරේක ආවරණ රාශියක් අතරින් ඔබේ අවශ්‍යතාවන්ට වඩාත් හොඳින් ගැළපෙන අතිරේක ආවරණ මූලික සැලසුමට එක්කර, ඔබේ ආදරණීයයන්ට ලැබෙන රැකවරණය වැඩිකරගත හැක.





### පාරිතෝෂික දීමනා

ඔබේ ආයෝජනයට ඉහළම ප්‍රතිලාභ හිමි කර දෙමින් සියළු වාරික ගෙවා ඔප්පුව කල් පිරෙන අවස්ථාවේ දී, අරමුදලේ වටිනාකමෙන් 10% ක පාරිතෝෂික දීමනාවක් ද පිරිනැමේ.

## අඛණ්ඩව වර්ධනය වන අරමුදලක්

සමාගම මගින් ප්‍රකාශයට පත්කරනු ලබන, ආකර්ෂණීය ලාභාංශ* අනුපාතයන් සමගින් ඔබේ අරමුදල සෑම මසකම වර්ධනය වේ.



| වර්ෂය | වර්ෂයට අදාළ අතුරු ලාභාංශ අනුපාතය | ප්‍රකාශයට පත්කළ ලාභාංශ අනුපාතය |
|---|---|---|
| 2015 | 8.00% | 9.50% |
| 2016 | 8.00% | 10.50% |
| 2017 | 10.00% | 10.25% |
| 2018 | 10.00% | 10.00% |
| 2019 | 10.00% | 10.00% |
| 2020 | 9.00% | 9.00% |
| 2021 | 8.00% | 8.00% |
| 2022 | 9.00% | 10.00% |
| 2023 | 9.00% | 13.50% |

*ඉහත වගුවේ දැක්වෙන පරිදි, වසර ආරම්භයේදී ප්‍රකාශයට පත් කරන ලද අතුරු ලාභාංශ අනුපාතයක් එම වර්ෂය සඳහා සහතික කර ඇති අතර එය වර්ෂය තුළ ඔබගේ අරමුදලට මාසිකව එක් කෙරේ. වර්ෂය තුළදී යුනිවර්සල් ජීවිත රක්ෂණ අරමුදලේ ආයෝජන ක්‍රියාකාරීත්වය මත සෑම වසරකම අවසානයේ බලපවත්නා සැබෑ ලාභාංශ අනුපාතය තීරණය කරනු ලබන අතර එම අනුපාතය ඕනෑම අවස්ථාවක, එම වසර සඳහා වන අතුරු ලාභාංශ අනුපාතයට වඩා අඩු නොවේ.



## සැලසුමේ විස්තර

වසර 10 ත් වසර 30 අතර කාලසීමාවක් සඳහා මෙම සැලසුම ලබාගත හැකි වේ.



අවම
වයස් සීමාව
අවුරුදු 18



උපරිම
වයස් සීමාව
අවුරුදු 65

## අරමුදල් පිළිබඳ නිදර්ශන

ඔබට වයස අවුරුදු 30 නම්, ඔබ අවුරුදු 15 ක් සඳහා හෝ අවුරුදු 20 ක් සඳහා Life+ සැලසුමක් ලබාගත්තේ නම්, ඔබගේ අරමුදලේ වර්ධනය සාමාන්‍යයෙන් පහත පරිදි වේ.

| වයස | සැලසුම් කාලය (අවුරුදු) | ජීවිත ආවරණය (රු.) | මූලික අමතර ආවරණ ඇතුළුව වාර්ෂික ආවරණය (රු.) | 8% ක ලාභාංශ සහිතව කල්පිරීමේදී නිදර්ශිත වටිනාකම (රු.) | 10% ක ලාභාංශ සහිතව කල්පිරීමේදී නිදර්ශිත වටිනාකම (රු.) | 12% ක ලාභාංශ සහිතව කල්පිරීමේදී නිදර්ශිත වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|
| 30 | 15 | 2,400,000 | 120,050 | 2,870,000 | 3,353,000 | 3,924,000 |
| 30 | 20 | 1,500,000 | 60,050 | 2,384,000 | 2,969,000 | 3,711,000 |



# LIFE + සමගින් වඩා ඉහළ රැකවරණයක්

වඩාත් පුළුල් ආවරණයක් සඳහා පහත සඳහන් අමතර ආවරණ ඔබගේ මූලික සැලසුමට එක්කළ හැක.

## සෞඛ්‍ය ආවරණ

| | |
|---|---|
| යුනියන් හෙල්ත් 360 ප්‍රතිලාභය **(H360)** | ඔබේ සියළු සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලන මෙම ආවරණය ඔබේ රක්ෂණ සැලසුමට එක් කර ගැනීමෙන් ඔබේ මුළු පවුලටම පරිපූර්ණ සෞඛ්‍ය රැකවරණයක් ලබාදිය හැක. |
| යුනියන් ස්මාර්ට් හෙල්ත් ප්‍රීමියර් ප්‍රතිලාභය **(USHP)** | අමතර ප්‍රතිලාභ රැසක් ලබාදෙන මෙම ආවරණය තුළින් ජීවිත රක්ෂිතයාගේ දෙමව්පියන්ගේ ත්, සහකරු/ සහකාරියගේ සහ වයස අවුරුදු 23ට අඩු දරුවන්ගේ ත් ශ්‍රී ලංකාව තුළ හෝ ලොව පුරා (ඇමරිකා එක්සත් ජනපදය සහ කැනඩාව හැර) වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කළ හැක. |
| රෝහල් දීමනා ප්‍රතිලාභය **(HCB)** | රෝහල් ගත වීමක දී අහිමිවන දෛනික ආදායම ප්‍රතිපූරණය කර ගැනීමේ හැකියාව |
| සුවමග ප්‍රතිලාභය **(SMB)** | බරපතළ රෝගාබාධයක් හෝ හදිසි ශල්‍යකර්මයක දී වෛද්‍ය ප්‍රතිකාර සඳහා එකවර මූල්‍ය ප්‍රතිලාභ ලබා ගැනීමේ හැකියාව |
| පූර්ණ සැත්කම් ප්‍රතිලාභය **(CSB)** | රෝගාබාධයක් හෝ හදිසි අනතුරක් හේතුවෙන් සිදු කළ යුතු ශල්‍යකර්මයක් සඳහා අවශ්‍ය වන මූල්‍යමය ප්‍රතිපාදන ක්ෂණිකව ලබා දෙයි. |
| ළමා සෞඛ්‍ය ප්‍රතිලාභය **(CHB)** | රෝහල් ගත කිරීමක දී දෛනික මූල්‍ය ප්‍රතිලාභ හිමිවන අතර ළමුන් සඳහා සැත්කම් 244ක් ආවරණය කරනු ලබන අමතර ආවරණයක් |

## අකර්මණ්‍යතා ආවරණ

| | |
|---|---|
| පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය - හදිසි අනතුරක් හෝ රෝගයක් හේතුවෙන් **(TPS)** | ඔප්පු කාල සීමාව ඇතුළත දී සිදුවන හදිසි අනතුරු හෝ අසනීප හේතුවෙන් පූර්ණ නිත්‍ය අකර්මණ්‍යතාවයට පත් වුවහොත් ආවරණ මුදල වාර්ෂික වාරික 5කින් හිමි වේ. |
| පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය - හදිසි අනතුරක් හේතුවෙන් **(TPA)** | හදිසි අනතුරු හේතුවෙන් පූර්ණ නිත්‍ය අකර්මණ්‍යතාවයට පත් වුවහොත් ආවරණ මුදල වාර්ෂික වාරික 5කින් හිමි වේ. |
| අර්ධ නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය - හදිසි අනතුරක් හේතුවෙන් **(EPD)** | හදිසි අනතුරක් හේතුවෙන් අර්ධ නිත්‍ය අකර්මණ්‍යතාවයට පත් වුවහොත් අදාළ ආවරණ ප්‍රතිශතයන් වන්දි වශයෙන් හිමි වේ. |

## අතිරේක ජීවිත ආවරණ

| | |
|---|---|
| සමකාල ප්‍රතිලාභය **(LTB)** | අමතර සුළු වාරිකයක් සමගින් ඔබේ මූලික රක්ෂිත මුදල මෙන් 10 ගුණයක් දක්වා ඔබේ ජීවිත ආවරණය තව දුරටත් වැඩි කර ගත හැකියි. |
| හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය **(ADB)** | හදිසි අනතුරක් හේතුවෙන් සිදුවන අභාවයක දී මූලික රක්ෂිත මුදලට අමතරව මූල්‍යමය රැකවරණයක් |
| සහකරුගේ ජීවිතය මත සමකාලීන ප්‍රතිලාභය **(SPB)** | සහකරු/ සහකාරියගේ අභාවයක දී එකවර ගෙවීමක් ලෙස මූල්‍ය ආවරණයක් හිමි වේ. |
| අවමංගල්‍ය වියදම් ප්‍රතිලාභය **(FEB)** | රක්ෂණ ඔප්පු හිමියාගේ අවමංගල්‍යයේ දී සිදුවන වියදම් ආවරණය කරනු ලබයි. |

## ආදායම් අහිමිවීම් ආවරණ

| | |
|---|---|
| **පවුල් ආදායම් ප්‍රතිලාභය (FIB)** | අකල් මරණයක දී නිත්‍ය අදායම් අහිමිවීම නිසා පවුලේ සාමාජිකයන්ට ඇතිවන මූල්‍යමය අපහසුතාවය අවම කරගැනීම සඳහා ඔප්පු කාල සීමාව අවසන් වන තුරු ලබා දෙන නිත්‍ය කාර්තුමය ගෙවීමක් |
| **වාරික ගෙවීමෙන් නිදහස් වීමේ ප්‍රතිලාභය (WP)** | මෙම ආවරණය මඟින් පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතාවයක දී (හදිසි අනතුරක් හෝ රෝගයක් හේතුවෙන් සිදුවන) ඔප්පුව කල්පිරීම දක්වා ඉතිරි වාරික ආයතනය මඟින් පියවමින් සම්පූර්ණ කල්පිරීමේ වටිනාකම ලබාදීමට කටයුතු කරයි. |

මෙම අත්පත්‍රිකාව පිළියෙළ කර ඇත්තේ තොරතුරු ලබාදීම සඳහා පමණි. මෙය ගිවිසුමක් හෝ ජීවිත රක්ෂණ ඔප්පුවක් නොවේ.
ප්‍රතිලාභ, බැහැරකිරීම්, කොන්දේසි හා නියමයන් සඳහා රක්ෂණ ඔප්පුව වෙත යොමුවන්න.
ආවරණය ආරම්භයේ දී වයස හා ප්‍රකාශිත ලාභාංශ ප්‍රතිශතයන් අනුව නිදර්ශිත අගයන් වෙනස් වේ.






යූනියන් ඇෂුවරන්ස්
ජෝන් කීල්ස් සමාගමකි

යූනියන් ඇෂුවරන්ස් පී එල් සී (PQ 12),
නො 20, ශාන්ත මයිකල් පාර,
කොළඹ 3, ශ්‍රී ලංකාව.

1330 (24x7 පාරිභෝගික සේවා)
+94 11 2990 990

unionassurance.com

info@unionassurance.com

අප හා සම්බන්ධ වන්න

යූනියන් ඇෂුවරන්ස් පී.එල්.සී. (PQ 12) විසින් නිකුත් කරන ලදී 03/2024